සියලු හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 **34 S I**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

කාලය පැය එකයි

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. සෑම සන්නිවේදන ක්‍රියාවලියක්හා බැඳී පවතින සන්නිවේදන වර්ගය වන්නේ,
1. සමූහ සන්නිවේදනයයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
3. අන්තර්වර්තී සන්නිවේදනයයි.
4. ජන සන්නිවේදනයයි.

02. මානව භාෂාව හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශ නම්,
a. නව අදහස් තොරතුරු ප්‍රකාශ කිරීමේ හැකියාව භාෂාවක තිබේ.
b. ද්විත්වභාවය යනු සෑම භාෂාවකම වචනයකට තේරුම් දෙකක් තිබීම.
c. කිසියම් ලේඛනයක ඵලදායීතාවය එහිඅන්තර්ගතය මත රඳා නොපවතී.
1. a හා c වේ. 2. a හා b වේ. 3. a, b හා c වේ. 4. b හා c වේ.

03. කාර්යාලයක් තුළදී තැපැල් මුදු යන්ත්‍රය වීක්නිලධාරියෙකු භාරයේ තබයි. මෙසේ වීමට ආසන්නතම හේතු නම්,
1. වැඩි කාර්යක්ෂමතාවයකින් කාර්යය කිරීම සඳහාය.
2. මුදල් ගණුදෙනුවක් නිසා වංචා සිදුවීම් වළක්වාගැනීම සඳහාය.
3. මුද්දර ඇලවීමට පහසු නිසාය.
4. දිනපතා ලිපි විශාල ප්‍රමාණයක් මුදු තැබිය යුතු නිසාය.

04. ගුවන් විදුලි මාධ්‍ය තුළ දැන්වීම් ප්‍රචාරණය සඳහාවැඩිම ඉල්ලුමක් ඇති විකාශන කාලසීමාව ලෙස ගත හැක්කේ,
1. ප්‍රවෘත්ති විකාශනය වන සීමාවයි.
2. අසන්නන්ගේ ගීත ඉල්ලීම් වැඩසටහන් තුළය.
3. ගුවන් විදුලි කෙටි නාට්‍ය වැඩසටහන් තුළය.
4. සෑම වැඩසටහනක් අතරතුරමය.

05. සංවර්ධනාත්මක කාර්යයේදී නව නිර්මාණ බිහි කිරීම මුලින් ම ආරම්භ වන්නේ,
1. සංවර්ධනය කළ යුතු වැඩ බිමේය.
2. සංවර්ධන කටයුත්තබාර ආයතනය තුළය.
3. පුද්ගලයාගේසිත තුළය.
4. සංවර්ධන ව්‍යාපෘතියක නියැලෙන අතරතුරය.

06. සිනමා මාධ්‍ය තුළ ඡායාරූප භාවිතා වීම වැදගත් වන්නේ,
1. රංගන ශිල්පීන්ගේ ඡායාරූප ලබාගැනීම සඳහාය.
2. සිනමා රූපගත කිරීම වලදී අඛණ්ඩව ආරක්ෂා විඇත්දැයි පරික්ෂා කිරීම සඳහාය.
3. නළු නිළියන්ගේ ඇඳුම් පැළඳුම් වල අඩුපාඩු බැලීම සඳහාය.
4. කැමරාවෙන් ප්‍රයෝජනවත් යමක් කළ යුතු නිසාය.

07. මානවයා අතීතයේ සිට වර්තමානය දක්වා තොරතුරු ලබා ගත් ආකාරය පිළිවෙලින් දක්වා ඇත්තේ,

| | | | | |
|---|---|---|---|---|
| 1. කථන භාෂාව | සංකේත | කඩදාසි නිර්මාණය | මුද්‍රණය | |
| 2. ඉඟි බිඟි | සංඥා | මුද්‍රණය | කඩදාසි නිර්මාණය | |
| 3. ගුහා චිත්‍ර | කථන භාෂාව | කඩදාසි නිර්මාණය | සංඥා | |
| 4. ඉඟි බිඟි | චිත්‍ර | කථනය | කඩදාසි නිර්මාණය | මුද්‍රණය |

08. උත්තල මුද්‍රණ ශිල්පයේ ප්‍රාථමික අවස්ථාව ලෙස දැක්විය හැක්කේ,
1. ඩිජිටල් මුද්‍රණය 2. සමතල මුද්‍රණය 3. ලි අච්චු මඟින් මුද්‍රණය 4. තිර මුද්‍රණය

09. මෙරට ගුවන් විදුලි විකාශනයේ නිර්මාතෘවරයා ලෙස සැළකෙන්නේ,
1. ඩී.එම්. කොළඹගේ මහතාය.
2. එඩ්වඩ් හාපර් මහතාය.
3. ශාන්වික්‍රමසිංහ මහතාය.
4. බොබ් ක්‍රිස්ට් මහතාය.

10. සමන්ප්‍රිය මහතා විසින් "අවර වැසි" නම් ටෙලි නාට්‍ය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සියල්ලම සැලසුම් කර අවශ්‍ය දේ සපයාදෙන ලදි. ඒ අනුව ඔහු එම ටෙලි නාට්‍යයේ,
1. අධ්‍යක්ෂකයා. 2. නිෂ්පාදකයා.
3. නිවේදකයා 4. වේශ නිරූපණ ශිල්පියාය.

11. සිනමාවේ මායාව උත්සන්න කරන අංග වන්නේ,
1. දැවැන්ත තිරය, අඳුර හා වර්ණ 2. මිනිස් රූප, ආලෝකය හා වේශ නිරූපණ
3. සංගීතය, දැවැන්ත තිරය හා නළු නිළියන් 4. අඳුර, ආලෝකය හා අභිනය

12. ආදි කාලීන ගෝත්‍රික සමාජයන්හි පණිවිඩ හුවමාරු කරගත් ආකාරයක් නොවන්නේ,
1. විරිඳු හා රූකඩ වේ. 2. ගිනිමැලය හා හූව වේ.
3. බෙර හඬ හා නලා හඬ වේ. 4. බෙර හඬ හා දුම වේ.

13. සමිතා ගුවන් විදුලියට සවන් දෙමින් තම චිත්‍රය ඇඳ අවසන් කළාය. ඒ අවස්ථාවේ විකාශනය වූ ප්‍රවෘත්ති සිරස්තල වල සමහර වචන ඇයට වැටහුණේනැත. මෙම අවස්ථා තුල උද්ගතව ඇත්තේ,
1. ශාරීරික බාධක අවස්ථාවකි. 2. මාධ්‍ය බාධක අවස්ථාවකි.
3. පරිසරාත්මක බාධක අවස්ථාවකි. 4. අර්ථ බාධක අවස්ථාවකි.

14. ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ගැනීමේ දී පහත කාර්යය සඳහා යොදා ගැනීමට යෝජනා කළ හැකි උපකරණ අනුපිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.
a. ඡායා පිටපත් ලබා ගැනීම.
b. ලිපියක් සකසා ගැනීම.
c. ව්‍යාපෘති වාර්තාව ගොනු කිරීම.
d. කඩදාසි ටිකි නිසි ප්‍රමාණයට සකසා ගැනීම.
1. බැඳුම් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය, පරිගණකය, අංකිත අනුපිටපත් යන්ත්‍රය
2. අංකිත අනුපිටපත් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය, DPT ක්‍රියාවලිය පරිගණක යන්ත්‍රය
3. අංකිත අනුපිටපත් යන්ත්‍රය, පරිගණකය, බැඳුම් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය
4. පරිගණකය, ලැමිනේටින් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය, බැවුම් යන්ත්‍රය

15. මාධ්‍ය ආයතනයක ක්‍රියාකාරීත්වය රඳා පවතින්නේ,
1. එහි සේවකයන් මත රඳා පවතී. 2. එහි හිමිකාරීත්වය මත රඳා පවතී.
3. ග්‍රාහකයන් මත රඳා පවතී. 4. මාධ්‍යවේදීන් මත රඳා පවතී.

16. "බේබි බෙයාර්" නවතම ළදරු සබන් වර්ගය පිළිබඳ දැනුවත් කිරීමේ දැන්වීම් මේ දිනවල සෑම මාධ්‍යනාලිකාවකම පාහේ විකාශනය වේ. මේ මඟින් අපේක්ෂිත බලපෑම නම්,
1. හඳුන්වා දීම හා පෙළඹවීමයි. 2. රසඥතාවය හා පෙළඹවීමයි.
3. තොරතුරු ලබා දීම හා පෙළඹවීමයි. 4. වෙළඳපොල හා පෙළඹවීමයි.

17. කැමරාව නිර්මාණය කිරීමට මූලික වූ උපකරණය නම්,
1. කැමරා කාචය 2. මැජික් ලන්තෑරුම 3. කැමරාඔබ්ස්කියුරාව 4. පටල පටිය

18. "බස් ගාස්තුව 15% ඉහළට" යන පුවත මඟින් වඩාත් ගම්‍ය වන ප්‍රවෘත්තියක ඇති ගුණාංගය නම්,
1. අසාමාන්‍ය බව 2. බලපෑම 3. ගැටුම 4. මානව ලැදියාව

19. ටැබ්ලොයිඩ් පුවත්පත් වලට වැඩි ග්‍රාහක ආකර්ෂණයක් ඇත්තේ,
1. ඡායාරූප වැඩි ප්‍රමාණයක් අන්තර්ගත නිසාය. 2. දෘඪ පුවත් පළ කරන නිසාය.
3. සරල හා ආකර්ෂණීය ආකෘතිය නිසාය. 4. දේශපාලන පුවත් අන්තර්ගතය නිසාය.

20. සිනමාවේදී ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා සිනමාව අරඹයා සිදුකළ මෙහෙවර අළලා පුවත්පතක පළවන ලිපිය කුමන වාර්තාකරණයට අදාළ වන්නේද?
1. නිර්මාණාත්මක වාර්තාකරණයටයි. 2. ඍජු වාර්තාකරණයටයි.
3. ප්‍රවෘත්ති වාර්තාකරණයටයි. 4. දෘඪ පුවත් වාර්තාකරණයටයි.

21. පුද්ගලයා ස්වයං වාරණයකින් යුතුව භාවිතා කළ යුතු සන්නිවේදන උපකරණයක් වන්නේ,
1. රූපවාහිනිය 2. ගුවන් විදුලිය 3. ජංගම දුරකථනය 4. පුවත්පත

22. ගුවන් විදුලි නිවේදකයෙක් භාවිතා කරන ප්‍රධානතම සන්නිවේදන ස්වරූපය නම්,
1. ශ්‍රව්‍ය සන්නිවේදනයයි. 2. දෘශ්‍ය සන්නිවේදනයයි. 3. වාචික සන්නිවේදනයයි. 4. කාය සන්නිවේදනයයි.

23. සමූහ සන්නිවේදනයේ ඇස් සම්බන්ධතාව වඩාත් වැදගත් වන්නේ,
1. යම් සභාවකට සිටින පුද්ගලයන් සමග සාකච්ඡා කිරීම සඳහාය.
2. යම් සභාවක සිටින පුද්ගලයන්ගේ අවධානය තමා වෙත රඳවා ගැනීම සඳහාය.
3. කථිකයා කථාව කරන අතරතුර සෑම කෙනෙකු වෙතම සිය ඇස් යොමු කිරීම සඳහාය.
4. විවිධ වූ කථන උපක්‍රම භාවිතකිරීම සඳහාය.

24. සන්නිවේදනය සම්බන්ධව නිරවද්‍ය නොවන ප්‍රකාශය නම්
1. සියලුම සන්නිවේදන වර්ගයන්හිදී තාක්‍ෂණික මෙවලම් භාවිතා වේ.
2. අන්තර්වර්තී සන්නිවේදනයේ දී ද ඇතැම් විට තාක්‍ෂණය භාවිතා විය හැකිය.
3. ජන සන්නිවේදනයේ දී තාක්‍ෂණික මෙවලම් භාවිතය අත්‍යාවශ්‍ය වේ.
4. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ප්‍රක්ෂේපණය මාධ්‍ය උපකරණ භාවිතය වැදගත් වෙයි.

25. එක්තරා ශිෂ්‍යයෙකු විසින් අවාචික සන්නිවේදනයේදී ප්‍රකාශවන සාධක වලට උදාහරණ පහත ආකාරයට දක්වා තිබුණි.

| | |
|---|---|
| 1. සමාජීය සාධක | a. ඇඳුම් පැළඳුම් , ගන්ධය |
| 2. පාරිසරික සාධක | b. ගෘහ හා උද්‍යාන අලංකරණය |
| 3. ශාරීරික සාධක | c. පුද්ගල හැසිරීම් හා පුද්ගලයින් අතර පරතරය |

මින් 1,2,3 හා වඩාත් ගැළපෙන පිළිතුර නම්,
1. c, b හා a වේ. 2. a, b හා c වේ.
3. b, a හා c වේ. 4. ඉහත කිසිවක් ගැළපිය නොහැක.

26. කෙටි ලිඛිත සන්දේශ යැවීම සඳහා පමණක් භාවිතා කරන ලද විද්‍යුත් උපකරණ නම්,
1. ජංගම දුරකථනය වේ. 2. ෆැක්ස් යන්ත්‍රය වේ. 3. පේජරය වේ. 4. විද්‍යුත් තැපැල වේ.

27. 9 ශ්‍රේණියේ ශිෂ්‍යයෙකු වන නුවන් විසින් ලියන ලද මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් පිළිබඳ වූ ලිපිය පුවත්පතක පළ කිරීමේ දී යොමු කෙරෙන අංශය ලෙස දැක්විය හැක්කේ,
1. දැන්වීම් අංශයයි. 2. විශේෂාංග අංශයයි. 3. ප්‍රවෘත්ති අංශයයි. 4. නිර්මාණාත්මක අංශයයි.

28. ශ්‍රී ලංකාවේ මුල් කාලීනව පුවත්පත් බිහිවීමේ මූලික අරමුණ වූයේ,
1. දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහාය.
2. යටත් විජිතවාදී නායකයන්ගේ මත ප්‍රකාශ කිරීම සඳහාය.
3. තොරතුරු ප්‍රචාරණ කටයුතු සඳහාය. 4. ආගම් ප්‍රචලිත කිරීම සඳහාය.

29. ටෙලි නාට්‍ය නැරඹීම හාසමාන වින්දනයක් ලබා දිය හැක්කේ,
1. වාර සඟරා වලටය. 2. චිත්‍ර කතා පුවත්පත් වලටය.
3. දිනපතා පුවත්පත් වලටය. 4. වේදිකා නාට්‍ය වලටය.

30. මුළු ගතම වෙහෙසුනා - දහඩියෙන් නැහැවුණා
කුසගින්න නිවා ගන්න මෙමා - යකඩ තලන්නා .....
ඉහත දැක්වෙන ගීත ඛණ්ඩය මගින් මාධ්‍ය තුළ කිනම් අංගයක් නිරූපණය වේද?
1. සමාජ පන්තිය 2. රසඥතාව 3. වැඩ ලෝකය 4. සාරධර්ම

31. ඩබ්.ඒ. සිල්වා මහතා විසින් රචිත "විජයබා කොල්ලය" සරසවි ප්‍රකාශයන් විසින් නැවත ප්‍රති නිෂ්පාදනය කරනු ලැබීය. ඒ තුළින් කර්තෘට හිමි විය යුතු මූල්‍ය ප්‍රතිලාභය අයත් වන්නේ,
1. ආර්ථික අයිතියයි. 2. සමාජීය අයිතියටයි.
3. සදාචාර අයිතියටයි. 4. නිර්මාණාත්මක අයිතියටයි.

32. පෝස්ටරයක් සම්බන්ධව සංවාද වගන්තිය වන්නේ,
1. නියමිත හා සුදුසු ස්ථානවල පමණක් ඇලවීමෙන්පරිසර හානිය අවම වේ.
2.
3.
4.

32. පෝස්ටරයක් සම්බන්ධව සංවාද වගන්තිය වන්නේ,
1. නියමිත හා සුදුසු ස්ථානවල පමණක් ඇලවීමෙන් පරිසර හානිය අවම වේ.
2. වෙළඳ, දේශපාලන හා සමාජීය තොරතුරු දැන්වීමට භාවිතා වේ.
3. පෝස්ටර් මගින් සමාජානුයෝජනය හා විනෝදාස්වාදය ලබාදේ.
4. නෙත සැණින් ගැටෙන පරිදි ජනාකීර්ණස්ථානවලින් ප්‍රදර්ශනය කළ යුතු වේ.

33. වාචික සන්නිවේදනය සංවර්ධනයෙහිලා වැදගත් ක්‍රියාමාර්ග පිළිබඳ අමන්දා, අමල් හා හසිනි දැක්වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
අමන්දා - සවන් දීමට හුරු පුරුදු වීම.
අමල් - අන්‍යයන්ගේ කථා හා අංග චලන, ඉරියව් පිළිබඳ අවධානයට ලක් නොකිරිම.
හංසනී - තමාසතු තොරතුරු නිතර යාවත්කාලීන කර ගැනීම.
මින් වඩාත් නිවැරදි මතය වන්නේ,
1. අමන්දාගේ හ කියමන සත්‍ය වන අතර අමල් හා හංසනීගේ කියමන් අසත්‍ය වේ.
2. අමන්දාගේ කියමන අසත්‍ය වනඅතර අමල් හා හංසනීගේ කියමන් සත්‍ය වේ.
3. අමන්දා , අමල් හා හංසනී පැවසූ කියමන් සියල්ල සත්‍ය වේ.
4. අමන්දා හා හංසනීගේ කියමන් සත්‍යවන අතර, අමල්ගේ කියමන් අසත්‍ය වේ.

34. ස්වර්ණමය නීති යනුවෙන් හඳුන්වන්නේ,
1. රූප රාමුව තුළ ඇතුළත් වස්තූන් නිසි පරිදි සංවිධානය කර ගැනීමයි.
2. රූප රාමුවේ සිරස්හා තිරස් පැතිවල තුනෙන් එක් වන ස්ථාන වලට මිනිස්ඇස වැඩියෙන් යොමු වීමයි.
3. ජ්‍යාමිතික හැඩතල හා විවිධ රටා අනුව රූප රාමුව ස්ථානගත කිරීමයි.
4. ඡායාරූප ශිල්පියා විසින් මෙහෙය වන දර්ශනරූපගත කර ගැනීමයි.

35. "මහනුවර ඇසළ සැණකෙළිය - 2018"
1. පුවත්පත් හා ගුවන් විදුලි දැන්වීමය.
2. අත්පත්‍රිකා හා රූපවාහිනී දැන්විම්ය.
3. පෝස්ටර් හා අත්පත්‍රිකාය.
4. පුවත්පත් දැන්වීම් හා පෝස්ටර්ය.

36. පසුගියදා ජාවා සුමාත්‍රා දූපත් ආශ්‍රිතව සිදු වූ යමහල් විදාරණය සම්බන්ධව තරු ෆ නාලිකා ඉදිරිපත් කළ විශේෂාංගය ඉතාම කාලෝචිතබව භූගෝල විද්‍යා ගුරුතුමා පවසන ලදි. මෙම වැඩසටහන කිනම් ආකෘතිය ලා ගත හැකිද?
1. නිවේදන
2. විචිත්‍රාංග
3. සජීවී විස්තර ප්‍රචාර
4. වාර්තා කථන

37. රූපවාහිනිය ඔස්සේ නිතර "රෙස්ලින්" වැඩසටහන් නරඹන දරුවෙක් තුළ
1. සාමකාමී දරුවෙකු ලෙස කටයුතු කරයි.
2. ප්‍රචණ්ඩකාරී ගති ඉස්මතු කරයි.
3. ඉගෙනීමට දැඩි උනන්දුවක් දක්වයි.
4. නිර්මාණශීලී දරුවෙක් වෙයි.

38. නුවන්ති මාධ්‍ය සංදේශ වල පවතින යහපත්අයහපත් බලපෑම් පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ඒවා භාවිතා කරන ශිෂ්‍යාවකි. මාධ්‍ය සංදේශවලඇති ගුණ දොස් පිළිබඳ නිරන්තරවම එම ආයතන දැනුවත් කරයි. ඒඅනුව නුවන්ති,
1. සක්‍රීය ග්‍රාහකයෙකි.
2. නිෂ්ක්‍රීය ග්‍රාහකයෙකි.
3. උදාසීන ග්‍රාහකයෙකි
4. මාධ්‍ය ග්‍රාහකයෙකි.

39. පහත වගන්ති අතරින් සත්‍ය වන්නේ,
A. සන්නිවේදන ක්‍රියාවලියක් සෑම විටම පුද්ගල කණ්ඩායමකින් ඇරඹේ.
B. සන්නිවේදන ක්‍රියාවලිය තුළ රූපවාහිනී හා ගුවන් විදුලිය ග්‍රාහකස්ථානයේ පෙනි සිටී.
C. සන්නිවේදන ක්‍රියාවලිය තුළ සියළු උපකරණ හෝ තාක්ෂණයට හෝ වඩා පුද්ගලයා වැදගත් වේ.
1. A හා B පමණි
2. B හා C පමණි.
3. C පමණි
4. A පමණි.

40. අවාචික හා වාචික සන්නිවේදන ස්වරූපයන්ට ගැළපෙන සාධක පිළිවෙලින්,
1. සංඥා, සංකේත හා භාෂාවයි.
2. රූප, සංඥා හා සංකේතයි.
3. චිත්‍ර, වචන හා රචනායි.
4. සංඥා, සංකේත හා ලේඛනයයි.

සියලු හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Department of Education Central Province**

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 34 S I |
|---|---|---|

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II** — **කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :**

- **පළමුවන ප්‍රශ්නය හා තවත් තෝරාගත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.**

(01) අනුරාධ විරසිංහ ප්‍රකට මාධ්‍ය විචාරකයෙකි. ඔහුගේ ලිපි නිතර පුවත්පත් වල පළවෙයි. ඔහුගේ විනෝදාංශය වන්නේ සිය මිතුරන් සමඟ සංචාරයෙහි යෙදීමයි.

i. අනුරාධගේ ලිපි පළවන පුවත්පත අයත් වන සන්නිවේදනවර්ගය කුමක් ද? එහි ලක්ෂණ 02 ක් ලියන්න.

ii. මාධ්‍ය විචාරය කරන්නට නම් ඔහු ජනමාධ්‍ය කෙරෙහි සුපරීක්ෂාකාරී විය යුතුය. ඒ සඳහා ඔහුට වැදගත්වන සන්නිවේදන ස්වරූප දෙකක් ලියන්න.

iii. පුවත්පතක ලිපි ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රභේද දෙකක් යටතේ දැකිය හැකිය. ඒ කුමන ප්‍රභේද ද?

iv. අනුරාධට නව මාධ්‍ය හරහා ද සිය විචාරාත්මක අදහස් ඉදිරිපත් කළ හැකිය. ඒ සඳහා යොදා ගත හැකි නව මාධ්‍ය පහසුකම් හතරක් ලියන්න.

v. මාධ්‍ය නිර්මාණ සම්බන්ධව නීතිමය තත්ව දැකිය හැකිය. මාධ්‍ය නියාමනයට ලක් කරන නියාමන ආයතන දෙකක් ලියන්න.

vi. අනුරාධට ඔහුගේ ලිපි මාධ්‍ය ආයතන වෙත වගකීමෙක් යැවිය හැකි නව මාධ්‍ය පහසුකම් දෙකක් ලියන්න.

vii. පුවත්පත් ආයතනයකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයන් දෙකොටසකට අයත් වේ. එම කොටස් දෙක නම් කරන්න.

viii. අනුරාධ සංචාරය කිරීමේ දී අංකිත කැමරාවක් භාවිත කරමින් ඡායාරූප ලබා ගනියි. ඡායාරූපකරණයේ විශේෂතා දෙකක් ලියන්න

ix. අනුරාධ "සන්නිවේදන හා සංජානනය" යනුවෙන් ලිපියක් පළ කළේය. "සංජානනය" යනු කුමක්ද?

x. අනුරාධ විසින් ලියනු ලබන ලේඛන වඩාත් ඵලදායී වීමට නම් බලපෑ හැකි ප්‍රධාන ලක්ෂණ දෙක ලියන්න.

(02) නූතනවේදී ජනමාධ්‍ය හා නව මාධ්‍ය වෙන් වෙන්ව තනි තනිව පවත්වාගෙන පැමිණි ස්වකීය අනන්‍යතාවලින් බැහැරව එකට එක්ව කටයුතු කරයි.

i. ඉහත තත්වය හැඳින්වෙන නාමය ලියන්න.

ii. වෙළඳ දැන්වීම් හෝ වෙනත් කාර්යයන් සඳහා මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ඒවායෙහි ආදායම ඉපැයීමේ අරමුණින් අලවි කරනු ලබන්නේ මොනවාද? වෙන් වෙන්ව ලියන්න.

iii. නව මාධ්‍යයෙහි ස්වභාවය කරුණු 03 ක් යටතේ පැහැදිළි කරන්න.

iv. රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද හතරක් නම් කර එයින් දෙකක් පිළිබඳව විස්තරයක් කරන්න.

(03) කපිල රජයේ පුවත්පත් සමාගමක ඡායාරූප ශිල්පියෙකු ලෙස සේවයට බැඳුණි.

i. කපිල සේවයට බැඳුණු පුවත්පත් සමාගම නම් කරන්න.

ii. පුවත්පතකට ඡායාරූප එකතු කිරීමට අමතරව එක් කෙරෙන රූපාශ්‍රිත විධි හතරක් ලියන්න.

iii. පුවත්පත් ඡායාරූප ශිල්පියෙකු සතු විය යුතු වෘත්තීය ශික්ෂණයට අදාළ ලක්ෂණ 03 ක් කෙටියෙන් පැහැදිළි කරන්න.

iv. පුවත්පත් කලාව සඳහා ඡායාරූප යොද ගැනීම "පුවත්පතට" බලපෑ අයුරු කරුණු හතරක් ඇසුරින් පැහැදිළි කරන්න.

(04) විද්‍යුත් ජන මාධ්‍ය මානව සන්නිවේදනයෙහිලා පුළුල් කාර්යයක් ඉටු කරයි.

i. විද්‍යුත් ජන මාධ්‍යයට පරිබාහිර අනෙක් ජනමාධ්‍ය ප්‍රභේදය කුමක්ද?

ii. ගුවන් විදුලි මධ්‍යස්ථාන සිය සම්ප්‍රේෂණ සඳහා යොදා ගන්නා ප්‍රධාන තරංග වර්ග දෙකක් ලියන්න.

iii. ගුවන් විදුලි පිටපත් රචකයෙකු පෙර සූදානම ඉතා වැදගත්ය. එහිදී වැදගත් වන කාරණා තුනක් කෙටියෙන් පහදන්න.

iv. රූපවාහිනී මාධ්‍ය හා ගුවන් විදුලි මාධ්‍ය අතර වෙනස සංසන්දනාත්මකව කරුණු හතරක් ඔස්සේ විමසීමට ලක් කරන්න.


(05) "බල්ලෙකු මිනිසෙකු සපා කෑ විට" පුවෘත්තියක් නොවූවත් "මිනිසෙකු බල්ලෙකු සපා කෑ විට" එයට පුවෘත්තිමය වටිනාකමක් හිමිවේ.

i. වාර්තාකරුවෙකු තොරතුරු රැස් කිරීමේ දී භාවිත කළ හැකි ශිල්පීය ක්‍රම දෙකක් නම් කරන්න.
ii. ඉහත දෙවන සිද්ධියට අදාළ පුවත්පත් ලිපියකට සුදුසු මූල පාඨය ලියන්න.
iii. නිර්මාණකරුවෙකු නව නිර්මාණයක් කිරීම බුද්ධිමය මෙහෙවරකි. නිර්මාණකරුවෙකුට බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම් දෙක නම් කර කෙටියෙන් පහදන්න.
iv. තොරතුරු රැස් කිරීමේ දී තොරතුරු රැස්කරන්නෙකු සැළකිල්ලට ගත යුතු ආචාර ධර්ම හතරක් පැහැදිළි කරන්න.

(06) "ග්‍රාහකයින් යනු මාධ්‍යයට සම්පත් උල්පතකි."

i. ගුවන් විදුලි මාධ්‍යයේ හා රූපවාහිනී මාධ්‍යයෙහි ග්‍රාහකත්වය නම් කරන්න.
ii. මාධ්‍ය ග්‍රාහකයාට ජනමාධ්‍ය වෙත ප්‍රතිචාර ඉදිරිපත් කළ හැකි ක්‍රම හතරක් ලියන්න.
iii. ජනමාධ්‍ය මගින් ළමයාගේ සමාජ දිවිය හැඩගැස්වීම සඳහා බලපානු ලබන කාරණා තුනක් විස්තර කරන්න.
iv. විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු නිපුණතා හතරක් පැහැදිළි කරන්න.

(07)




i. ඉහත ආකෘතිය ඉදිරිපත් කළේ කවුරුන්ද?
ii. ඉහත A, B, C, D පිළිවෙලින් නම් කරන්න.
iii. B හි ප්‍රභේද දක්වා පන්ති කාමරයක සිදුවීම් ඇසුරින් එම ප්‍රභේදවල අදාළ උදාහරණයක් බැගින් ලියන්න.
iv. පන්ති කාමරයක් තුළ භාවිත මාධ්‍ය උපකරණ දෙකක් දක්වන්න.
පන්ති කාමරයකදී මාධ්‍ය උපකරණ භාවිතයේ දී ඇති වැදගත්කම කරුණු තුනක් යටතේ පැහැදිළි කරන්න.

**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - 2018**
**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය - 11 ශ්‍රේණිය**
**විසඳුම් පත්‍රය - I කොටස**

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 11 - 1 | 21 - 3 | 31 - 1 |
| 2 - 4 | 12 - 1 | 22 - 3 | 32 - 3 |
| 3 - 2 | 13 - 4 | 23 - 2 | 33 - 4 |
| 4 - 1 | 14 - 3 | 24 - 4 | 34 - 2 |
| 5 - 3 | 15 - 2 | 25 - 1 | 35 - 3 |
| 6 - 2 | 16 - 4 | 26 - 3 | 36 - 4 |
| 7 - 4 | 17 - 3 | 27 - 2 | 37 - 2 |
| 8 - 3 | 18 - 2 | 28 - 4 | 38 - 1 |
| 9 - 2 | 19 - 3 | 29 - 2 | 39 - 3 |
| 10 - 2 | 20 - 1 | 30 - 3 | 40 - 1 |

(1x40 = 40)

## II කොටස

(01) I.
- ජන සන්නිවේදනය සන්දේශය පොදු වූවකි.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා මඟින් ක්‍රියාත්මක වේ.
- සංවිධිත ආයතනයන් මඟින් ක්‍රියාත්මක වේ.
- ග්‍රාහක පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගනියි.
- වෘත්තීය සන්නිවේදකයෝ කටයුතු කරති.
- මූලික වශයෙන් ඒකමාර්ගික වේ.
- තාක්ෂණික උපකරණ භාවිතයට ගැනේ.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ඇත්තේ දුරස්ථ සම්බන්ධයකි. සාපේක්ෂව ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වේ.
- සාමූහික කාර්ය පද්ධතියකි.

වර්ගය නම් කිරීමට 1
ලක්ෂණ දැක්වීමට 1/2 x 2 =1

ii. දෘශ්‍ය / ශ්‍රව්‍ය/ ලිඛිත (1x2 = 2)
iii. දෘඪ පුවත් / මෘදු පුවත් (1x2 = 2)
iv. වෙබ් අඩවි / බ්ලොක් අඩවි / ෆේස් බුක් / ටුවිටර්/ ඉන්ස්ටර්ග්‍රෑම් / යූ ටියුබ් (1/2x2 = 2)
v. රූගුම් පාලක මණ්ඩලය, විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව (1x2 = 2)
vi. ෆැක්ස් / ඊමේල් (1x2 = 2)
vii. මාණ්ඩලික මාධ්‍යවේදීන් හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් (1x2 = 2)
viii.
- ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේ දීම නැරඹිය හැකිවීම
- අඩු ආලෝක තත්ත්වයක් යටතේ වුවත් ඡායාරූප ගැනීමට හැකිවීම.
- ඉහළ කාර්යක්ෂමතාවයෙන් යුතුවීම.
- අනවශ්‍ය ඡායාරූප මකා දැමීමට හැකිවීම, සේයා පටල මිලදී ගැනීමට අවශ්‍ය නොවීම නිසා භාවිතය ලාභදායී වීම.
- වෙනත් සන්නිවේදන ජාලයන්ට පහසුවෙන් යොමු කළ හැකිවීම යනාදී වශයෙන් 10 ශ්‍රේණියේ
- නිශ්චල ඡායාරූප ශිල්පය නිපුණතා පාඩමේ (149) පිටුවෙහි කරුණුවලටඅදාළ පිළිතුරු භාරගන්න.

(1x2 = 2)

ix. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මඟින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම සංජානනය වේ. (ල. 02)

x. නිරවුල් බව හා පැහැදිලි බව ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව සම්මත ව්‍යාකරණ විධි භාවිතය. (1x2=2)

(02) i. අභිසාරී මාධ්‍ය (ල. 01)

ii. මුද්‍රිත මාධ්‍යයෙහි 'ඉඩ' අලවි කරයි.
විද්‍යුත්මාධ්‍ය 'කාලය' අලවි කරයි.

iii.
- භූගෝලීය වශයෙන් සීමා නොවීම
- ග්‍රාහකයාට අභිමත පරිදි සංදේශ තෝරා ගැනීමට හැකිවීම.
- ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයක සිට භාවිතා කළ හැකිවීම
- ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම. (1x3=3)

( 11 ශ්‍රේණියේ - 109 පිටුව යනාදී වශයෙන් කරුණු දැක්වීම)

සඩග ක ප්‍රවෘත්ති ක වාර්තා වැඩසටහන්
ක ටෙලි නාට්‍ය ක සංගීත වැඩසටන්
ක සාකච්ඡා, සංවාද ක සඟරාමය වැඩසටහන්
ක යථාකාරී රූපවාහිනී වැඩසටහන්
ක සජීවී විකාශ

වර්ගය නම් කිරිමට 1ය2 ෟ4 2
විස්තර කිරීම 1 ෟ2 ‸ 2

(04) සග සීමාසහිත එක්සත් ප්‍රනෘත්ති පත්‍ර සමාගම හෙවත් ලේක් හවුස් ආයතනය (ල.01)

සසග කාටූන්/ චිත්‍ර/ග්‍රැෆික්/ ප්‍රස්තාර / සිතියම් යනාදී ලෙස
ගැළපෙන පිළිතුර සඳහා 1ය2 ෟ4 2

සසසග ක ඡායාරූපකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම
ක නිර්මාණශීලී බව
ක නව තාක්ෂණය හා අත්වැල් බැඳගැනීම.
ක කලට වෙලාවට වැඩකිරීම.
යනාදී වශයෙන් ගැළපෙන පිළිතුර 10 ශ්‍රේණියේ -164 පිටුවේ සඳහන් පරිදි වේ නම් ලකුණු ලබාදෙන්න.
(කෙටි පැහැදිලි කිරීමක් ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. 1 ෟ3 3

සඩග ක අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව
ක තාත්වික බව නිසා ග්‍රාහක විශ්වසනීයත්වය දිනා ගැනීමට හැකිවීම.
ක පහසුවෙන් ග්‍රාහක ආකර්ශනය ලබාගැනීමට හැකිවීම.
ක පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට හැකිවීම.
ක ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව
(කෙටි පැහැදිලි කිරීමක් ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. 1 ෟ44

(04) සග මුද්‍රිත මාධ්‍යය (ල.01)

සසග ක මධ්‍යම තරංග
ක කෙටි තරංග
ක සංඛ්‍යාත මූර්ජන තරංග 1 ෟ2 ‸ 2

සසසග ක වැඩසටහන් පරමාර්ථය
ක වැඩසටහන ඉදිරිපත් කරන මාදිලිය
ක ඒ සඳහා භාවිත කරන ආකෘතිය
ක තම ග්‍රාහක කණ්ඩායම
ක වැඩසටහන ඉදිරිපත් කරන ගුවන් කාලය

(නම් කර ඇත්නම් 1ය2 ෟ3 1 1ය2*
(සම්පූර්ණ ලකුණු ලබාදීමට විස්තර කළ යුතුය ල. 03)

iv.

| ගුවන් විදුලි මාධ්‍ය | රූපවාහිනී මාධ්‍ය |
|---|---|
| ශ්‍රව්‍ය මාධ්‍යයයි. | ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයයි. |
| ශබ්දය පාදක වු මාධ්‍යයකි. | රූපය හා ශබ්දය පාදක වුවද රූපය ප්‍රමුඛ වේ. |
| ගැඹුරු සංකීර්ණ අදහස් ග්‍රාහක ගත කිරීම අපහසුය. | ගැඹුරු සංකීර්ණ අදහස් වුවද ඉදිරිපත් කළ හැකිය. |
| සාපේක්ෂව වියදම් අඩු මාධ්‍යයකි. | සාපේක්ෂ වියදම් අධික මාධ්‍යයකි. |
| රූපවාහිනියට සාපේක්ෂව ක්ෂණික මාධයයකි. | ගුවන් විදුලියට සාපේක්ෂව තොරතුරු ගලායාම වේගවත් බවින් අඩුය. |
| පරිකල්පනීය මාධ්‍යයකි. | ආකර්ෂණීය මාධ්‍යයකි. |

සංසන්දනාත්මකව කරුණු දැක්වීමට ලකුණු ලබාදෙන්න ල. 04

(05) i.
- සම්මුඛ සාකච්ඡා
- ප්‍රශ්නාවලි
- නිරීක්ෂණය
- ලේඛන පරිශීලනය
- බුද්ධි පරීක්ෂණය

1/2 x2= 1

ii. කවුද? කුමක්ද? කවර අවස්ථාවකද? කොහේද? කෙසේද? කුමක් නිසා එසේ සිදුවිණිද යනාදී කරුණු වලින් අඩු වශයෙන් හතරක මූල පාඨයෙහි සඳහන් නම් මුළු ලකුණු ලබාදෙන්න. (ල.02)

iii.
- සදාචාරාත්මක අයිතිවාසිකම්
- ආර්ථික අයිතිවාසිකම්

iv.
- පෞද්ගලිකත්වයට හානි කරන හෝ හෙළි කිරීමට අකමැති තොරතුරු ඉල්ලා නොසිටිය යුතුය.
- දත්ත දායකයා වෙහෙසට පත් නොකළ යුතුය.
- තොරතුරුවල රහස්‍යතාවය ආරක්ෂා කළ යුතුය.
- අදාළ තොරතුරු පමණක් විමසිය යුතුය.

(11 ශ්‍රේණියේ පිටු අංක 12-13)
( කරුණු සමඟ පැහැදිළි කිරීමට 1x4 =4 )

(06) i. ක්ලොඩ් ෂැනොන් හා වොරන් වීවර් (ල.01)

ii. A- සම්ප්‍රේෂකයා
B- ඝෝෂා / බාධක
C - ග්‍රාහකයා
D - අග්‍රස්ථානය (1/2x4=2)

iii.

බාධක
- මාධ්‍ය බාධක
- අර්ථ බාධක

(බාධක නම් කිරීම 1x2 =2)
(උදාහරණ සඳහා 1/2x2=1)

iv. ● කළු ලෑල්ල ● කොළ ලෑල්ල ● චුම්බක පුවරුව
● සුදු ලෑල්ල ● පිටු පෙරලනය ● අන්තර් ක්‍රියාකාරීත්වය

ආදී වශයෙන් සුදුසු නම් කිරීමට 1/2x2 = 1

- ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය පහසු කරයි.
- ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයෙහි ඵලදායීතාව ඉහළ නංවයි.
- උද්‍යෝගිමත් හා ආකර්ශණීය ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් ගොඩනංවයි.
- තොරතුරු ග්‍රහණයට, තේරුම් ගැනීමට, මතකයේ තබාගැනීමට පහසු කරයි.

(10 ශ්‍රේණියේ පිටු අංක 84) (කරුණු 03 දැක්වීමට 1x3=3)

(06) i. ගුවන් විදුලි මාධ්‍ය - ශ්‍රාවකයා
රූපවාහිනී මාධ්‍ය - ප්‍රේක්ෂකයා

ii.
- තැපැල්පත්
- දුරකථන ඇමතුම්
- විද්‍යුත් තැපෑල
- කෙටි පණිවිඩ
- සමාජ ජාල වෙබ් අඩවි
- පුවත්පත් වලට ලිපි සම්පාදනය
- ලිපියකින් ප්‍රතිචාර දන්වා යැවීම
- මාධ්‍ය පා ගමනක් හෝ උද්ඝෝෂණය සංවිධානය 1/2x4 = 2

iii.
- සාම්ප්‍රදායික භාෂාව වෙනස් වීම.
- අවර ගණයේ රසවින්දනයට හුරුවීම.
- මාධ්‍ය වැඩසටහන් වලින් නිරූපණය කරන චරිත ළමුන්ගේ වීරයන් බවට පත්වීම.
- අපගේ සමාජ සංස්කෘතියට නොගැළපෙන විලාසිතාවලට යොමුවීම.

(11 ශ්‍රේණියේ - පිටු අංක 118-119) කරුණු නම් කිරීමට 1/2x3=1 1/2)
(විස්තරාත්මකව කරුණු දැක්වීමට 1/2x3 = 1 1/2)

iv. 11 ශ්‍රේණියේ පිටු අංක 104 (කරුණු පැහැදිළි කිරිමට 1x4=4)